අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය - 2020
පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍ර මාලාව

සිංහල භාෂාව හා සාහිත්‍යII © All Right Received www.learntv.lk පැය 03

ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය යොදා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i) සිංහල හෝඩියේ

අ) 'ප' වර්ගයට අයත් අක්ෂර 2ක් ද

ආ)'ට' වර්ගයට අයත් අක්ෂර 2ක් ද ලියන්න

ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

"මෙවර ශිෂ්‍යත්ව විභාගයෙන් නංගී ලබාගත් සාමාර්ථය ඉහලින් අගය කෙරින"

iii) පහත සඳහන් පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න

අ) මැද + ඇඟිල්ල ආ) මත් + හල

iv) "දෙමාපියන්ගේ සිතුම් පැතුම් ඉටුකරන පින්වත් දරුවෝ ප්‍රීතිමත් ජීවිත ගත කරති"

මෙම වාක්‍යයේ ඇති

අ) තද්ධිත පදයක් හා

ආ) කෘදන්ත පදයක් ලියා දක්වන්න

v) පහත වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් විභක්ති වර්ගය නම් කරන්න.

අ) **වනයෙහි** වන මල් පිපී ඇත

ආ) වර්තමානයේ **ශිෂ්‍ය ශිෂ්‍යාවෝ** දුරස්ථ අධ්‍යාපනයෙන් දැනුම ලබති

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

vi) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියා දක්වන්න.

අ) දිවි ඇති තාක්

ආ) බිත්තරයෙන් උපන්

vii) පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා නැවත ලියන්න.

අ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති

ආ) මම නවකතාවක් රචනා කළෙමි

viii) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න

අ) මම විභාගයෙන් සමත් වෙති යි ගුරුවරු සිතති

ආ) අපි අනාගත නායකයන් ලු

ix) පහත සඳහන් යෙදුම් සඳහා ධීවර භාෂාවේ යෙදෙන වචන ලියන්න.

අ) මසුන් මැරීම ආ) දැල් අදින පුද්ගලයන්

x) අ) සමාන පද දෙකක් එක් වී සෑදෙන යුගල පදයක් ද

ආ)අර්ථ විරහිත පද දෙකක් එක් වී සෑදෙන යුගල පදයක් ද ලියා දක්වන්න.

02) පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

**අ)** ශ්‍රී ලංකාව ගෝලීය වසංගතයකට මුහුණ දී සිටින සමයකට අපි පිවිස සිටිමු. කොරෝනා හෙවත් කොවිඩ් 19 වෛරසය සඳහා තවමත් ගෝලීය වශයෙන් නිශ්චිත ඔසුවක් හඳුන්වා දී නැත.එවන් පසුබිමක අපට විශාල සමාජ වගකීමක් ඇති බව පැහැදිලි ය. පොදුවේ බැඳුණු සමාජ වගකීම් රැසක් පවතී. ආත්මාර්ථකාමීත්වයෙන් තොරව යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරමින් කොරෝනා වසංගතය දුරු කිරීමට එම සමාජ වගකීම් අප ඉටු කළ යුතු ය. එසේ නො වුවහොත් මෙම වසංගතය හමුවේ ලොව ධනවතුන් පවා දණින් වැටුණා සේ අපට ද දණින් වැටි විශාල පසුබෑමකට මුහුණ දීමටත් ජිවිතයෙන් පවා වන්දි ගෙවීමටත් සිදුවනු ඇත.

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

LearnTV

ආ) ස්වාභාවික විපත්ති යනු බොහෝ විට මිනිසා විසින් දැන හෝ නො දැන කරනු ලබන මිනිස් ක්‍රියාකාරකම්වල අමිහිරි ඵල විපාක මිස ඒවා අහඹු සිදුවීම් නො වේ. මේ සඳහා හේතු වන කරුණු බොහෝ ය කලාතුරකින් පැමිණ මහත් විනාශයක් ගෙන දුන් සුනාමිය හැරුණු විට අප මුහුණ දෙන ස්වාභාවික විපත්ති අතර ගං වතුර, නියඟය, සුළිසුළඟ, නාය යෑම් ආදිය ප්‍රධාන වේ.සොබාදහම හා මිනිසා අතර සබඳතාව දුරස් වෙද්දී මුහුණපාන ස්වාභාවික විපත් ද ඉහළ යයි. ඒ නිසා සොබා දහම හා මිනිසා අතර අන්‍යෝන්‍ය සබඳතාවක් පැවතිය යුතු ය.සොබාදහම අපට කාරුණික වන්නේ අප සොබාදහමට අවනත වන තාක් පමණි.

ඉ) කායික හා මානසික සමබරතාවය සිහිත මිනිසුන් සමාජයට දායාද කිරීම සඳහා ක්‍රීඩාව විශාල කාර්යභාරයක් ඉටු කරයි. එවැනි පුරවැසියෝ රටකට ඉමහත් මහෝපකාරී වෙති.ලැබුණු ඕනෑ ම අභියෝගයකට මුහුණ දිය හැකි නිරෝගිමත් පිරිසකි. එබැවින් සමබර පෞරුෂයක් සඳහා ක්‍රීඩාවේ මග පෙන්වීම ඉතා විශාල ය. වර්තමානයේ බොහෝ දෙනා පෙළෙන දියවැඩියාව, හෘදයාබාධ,අධිරුධිර පීඩනය ආදි බෝ නො වන රෝගවලට හේතුවක් වන්නේ සිරුරට අවශ්‍ය ව්‍යායාම නොලැබීම බව වෛද්‍ය මතයයි. ව්‍යායාම හා ක්‍රීඩා කිරීමෙන් මේ තත්ත්වයන් පහසුවෙන වළක්වාගත හැකි ය.

ඊ) ලෝක ක්‍රියාකාරිත්වයට අවශ්‍ය ලෙස අනුහුරු වෙමින් ජනතාවගේ නොයෙකුත් අවශ්‍යතා ඉටු කිරීමට අද වනවිට අන් මාධ්‍යන්ට වඩා අන්තර්ජාලය සමත් වී තිබේ. ඒවා අතරින් අධ්‍යාපන කාර්යය ප්‍රධාන වේ. අධ්‍යාපනයේ මූලාශ්‍ර සාගරයක් ලෙස අන්තර්ජාලය හැඳින්විය හැකි ය. අධ්‍යාපනය ලැබීමේ සාම්ප්‍රදායිකව මාධ්‍යයන්ට වඩා නව අධ්‍යාපන ප්‍රවණතාවයට අන්තර්ජාලය එක් වී හමාර ය. අන්තර්ජාලය භාවිතයෙන් අධ්‍යාපනය ලැබීමේ ශක්‍යතාවය දැන් බහුතරයකට හිමි වි ඇත.

03) පහත දැක්වෙන ඡේදය වචන 55 - 65 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදු වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න

ශ්‍රී ලංකාවේ දැකිය හැකි අනෙකුත් කලා අංග දෙස බලන විට චිත්‍ර කලාවට හිමි වි ඇත්තේ අද්විතිය ස්ථානයකි. චිත්‍රයක් යනු ප්‍රාථමික සන්නිවේදන ක්‍රමයක් ලෙස හැඳින්විය හැකි ය .ඒ සඳහා ඉතිහාසයක් ඇත. ප්‍රාථමික මානවයා තමන්ගේ භෞතික පරිසරය මෙන්ම ඔවුන්ගේ ජිවිතයේ මුහුණ පාන්නට සිදු වු විවිධ අවස්ථා අන්‍යන්ට ප්‍රකාශ කිරිමේදි සන්නිවේදන මාධ්‍යයක් ලෙස ආරම්භ වු මෙම චිත්‍ර කලාව වර්තමානය දක්වා අඛණ්ඩව පවතින කලාවක් ලෙසද හැඳින්විය හැක ය.

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

ප්‍රාථමික මානවයාට චිත්‍ර කලාව පිළිබඳ කිසිදු ශිල්පීය ඥානයක් හෝ අවශ්‍ය අමුද්‍රව්‍ය හෝ නො විය. එහෙත් ශ්‍රමයෙන් මානවයාගේ මොළයේ වර්ධනයත් සමග සිතීමේ ශක්තිය දියුණුවීමත් චිත්‍ර කලාවේද වර්ධනයක් වූ බව අවිවාදාත්මක කරුණකි. තමන් දකින අසන දෑ වෙනත් කලා මාධ්‍යයකින් ප්‍රකාශ කිරීමට වඩා චිත්‍රයක් මගින් එය නිරූපණය කිරීමට මිනිස්සු උනන්දු වූහ.ප්‍රාථමික චිත්‍ර ලෙස හඳුන්වනු ලබන්නේ බළන්ගොඩ මානවයාගේ කායික හා සංස්කෘතික පරපුර වූ ආදි වැද්දන් විසින් අඳින ලද ඒවා ය. දඩයම් යුගයක ජීවත් වූ පිරිසක් බැවින් ජීවිතයේ දකින අසන දෑ චිත්‍රයට නැගීමට ගත් උත්සාහයක් ලෙස ප්‍රාථමික ලෙන් චිත්‍ර හඳුනා ගත හැකි ය.

04) පහත දැක්වෙන ජේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

"හෙළ හවුල" යනු කවි සංවිධානයක් නො වේ කුමාරතුංග මුනිදාස මහතාගේ ප්‍රමුඛත්වයෙන් බිහි කළ සිංහල භාෂාව හා ජාතික පුනරුදය මුල් කොටගත් සංවිධානයකි.

හෙළ හවුල පිහුටුවා ඇත්තේ 1941 දී ය. එය ජාතික ව්‍යාපාරයට මෙන් ම පිරිවෙන් ආශ්‍රිතව නිර්මාණය වූ භාෂා සාහිත්‍ය පුනරුදයට වඩා වෙනස් ආකාරයකින් ජාතිය, භාෂාව, ඉතිහාසය ආදිය විග්‍රහ කළ හැකි සුවිශේෂ පිරිසකගේ සංවිධානයක් ලෙස හැඳින්විය හැකිය. එම යුගයේ ජාතික ව්‍යාපාරය තුළ ප්‍රධානත ම සටන් පාඨය වුයේ "රට දැය සමය" යන ත්‍රිත්වයයි. හෙළ හවුල එයට වෙනස්ව "දෙස බස රැස" යන සටන් පාඨය නගාලීය. එනම් දේශය, භාෂාව හා ජාතිය යන සංකල්ප තුනයි. ආගම වෙනුවට බස නගා සිටුවීමට ඔවුන් ගත් උත්සහය ඒ යුගයේ වෙනත් සංවිධානවලින් ඔවුන්ව වෙන් කරන ප්‍රධාන අනන්‍යතා සාධකය විය. භාෂාව පිළිබඳ හෙළ හවුල දැරූ මතය නම් පාලි, සංස්කෘත, දෙමළ, ඉංග්‍රිසි මෙන් ම වෙනත් භාෂාවලින්ද දූෂණය නොවූ ශුද්ධ සිංහල වචන හා යෙදුම්වලින් බස පෝෂණය කිරීමය.

1 ) හෙළ හවුලේ පුරෝගාමියා කවරෙක් ද?

2) හෙළ හවුලේ සටන් පාඨය කුමක් ද?

3) එවක පැවති සංවිධාන වලින් හෙළ හවුල සංවිධානය වෙනස් වන්නේ කුමන සාධකයකින ද?

4) භාෂාව පිළිබඳ හෙළ හවුල දැරූ මතය ලියා දක්වන්න

5) පහත සඳහන් පදවල තේරුම් ලියන්න
අ) සමය
ආ) පුනරුදය

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එළ කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

05) පහත සඳහන් විස්තරය පදනම් කරගෙන රාජකාරි ලිපියක් ලියන්න

රත්මලේ විද්‍යාලෝක විද්‍යාලයට ඉදිරිපස මාර්ගයේ ඇඳ ඇති හරස් පදික ඉරි මැකී ගොස් ඇත.එම මාර්ගයේ පිහිටි මාර්ග සංඥා පුවරුව ද අකර්මන්‍ය වී ඇත. එය එම පාසලේ ඉගෙනුම ලබන සිසුන්ගේ ආරාක්ෂාවට මහත් බාධකයක් වන අතර හැකි ඉක්මනින් එම ගැටලුවලට විසඳුම් ලබාදෙන මෙන් මාර්ග ෂංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය ඉංජිනේරුතුමාට යවන රාජකාරි ලිපිය ලියන්න.රත්මලේ විද්‍යාලෝක විදුහලේ පාසල් සංවර්ධන සමිතිය ලේකම් කේ. ඩී. කේ. පෙරේරා ඔබ යැයි සිතන්න.

(වචන 100ක් පමණ ප්‍රමාණවත්ය)

නැතහොත්

පහත දැක්වෙන විස්තරය පදනම් කරගෙන වෙළඳ දැනවීමක් සකස් කරන්න.

කිසියම් වෙළඳ දැන්විමක් උපුටාගත් කොටස් කීපයක් පහත දැක්වේ. මේ තොරතුරු පදනම් කර ගනිමින් කළුතර 'සමගි මාවතේ' පිහිටි ඉසුරු පොත්හල 2021 ජනවාරි මාසයේදි තම ප්‍රචාරක කටයුතු සඳහා පිළියෙළ කරන වෙළඳ දැන්විම සකසන්න

ජනවාරි මාසය තුළ
20% වට්ටම්
සහිතව ලබා ගත හැක

සෑම පෝය දිනකම වසා
ඇත

සියලුම විෂයන් සම්බන්ධ
අභ්‍යාස පොත් හා සියලුම
පාසල් උපකරණ සෑම
විෂයකටම සම්බන්ධ පොත්

කාලසටහනක්
දින දර්ශනයක්
අවුරුදු ලිතක්
නොමිලේ ලබා ගන්න

සතියේ දිනවල
උදේ 9 සිට රාත්‍රී7 දක්වාත්
සෙනසුරාදා හා ඉරිදා දිනවල
උදේ 9 සිට 2 දක්වා ත්
විවෘත ව පවති

LearnTV

මෙම ප්‍රශ්න පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණිම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම **බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.**
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.